# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2355/30 - 2023 ඔක්තෝබර් මස 25 වැනි බදාදා - 2023.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021 (II)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වන වගන්තියේ (5) වන උපවගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 71 වන වගන්තිය යටතේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2023 අංක 3 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ-තීරු බදු රහිත මෙහෙයුම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් හෝ තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම් කරගෙන යාමට අදහස් කරන බලයලත් තැනැත්තකු, පිළිවෙළින් (3) වන හෝ (4) වන අනුනියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලිය යුතු ය :-

(2) අවස්ථාවෝචිත පරිදි, (3) වන හෝ (4) වන අනුනියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලීමෙන් පසුව,තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් සහ තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර-තීරු බදු රහිත මෙහෙයුම් ලෙස නම් කරනු ලැබිය හැකිය.

(3) තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් පිළිබඳ ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරන බලයලත් තැනැත්තකුට පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරන ලෙසට නියම කරනු ලැබිය යුතු ය:-


1A - G 6512— 366 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) ඇමෙරිකානු ඩොලර් මිලියන පහක අවම ආයෝජනයක් සිදුකිරීම,

(ආ) ඒ බලයලත් තැනැත්තාට තීරු බදු රහිත වෙළෙඳ මෙහෙයුම් සම්බන්ධයෙන් ගෝලීය වශයෙන් පළපුරුද්දක් ඇති බවට සහ සුඛෝපභෝගී ඉහළ නැමියාවක සන්නම් නාමලත් සිල්ලර නිෂ්පාදන සමූහයකට ප්‍රවේශය ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන පරිදි කරුණු පැහැදිලි කිරීම;

(ඇ) අවසරලත් පාරිභෝගිකයන්ගේ තොරතුරු තහවුරු කර ගැනීම උදෙසා කොමිෂන් සභාව විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග පවත්වාගෙන යනු ලබන මගී පිවිසුම් ලියාපදිංචි කිරීමේ බාධා රහිත ඒකාබද්ධ ක්‍රියාවලිය අදාළ කර ගැනීම ; සහ

(ඈ) කොළඹ වරාය නගරය (තීරුබදු රහිත මෙහෙයුම්) රීතිවලට අනුකූලව, ශ්‍රී ලංකා රේගුව තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් පිළිබඳ අනුකූලතා සුපරීක්ෂණයන් සහ අධීක්ෂණයන් අදාළ කර ගැනීම.

(4) තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම් පිළිබඳ ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරන බලයලත් තැනැත්තකුට පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරන ලෙසට නියම කරනු ලැබිය යුතු ය.

(අ) ඇමෙරිකානු ඩොලර් මිලියන හතක අවම ආයෝජනයක් සිදුකිරීම ත සහ

(ආ) අවසරලත් පාරිභෝගිකයන්ගේ තොරතුරු තහවුරු කර ගැනීම උදෙසා කොමිෂන් සභාව විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග පාවත්වාගෙන යනු ලබන මගී පිවිසුම් ලියාපදිංචි කිරීමේ බාධා රහිත ඒකාබද්ධ ක්‍රියාවලිය අදාළ කර ගැනීම.

3. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර-තීරු බදු රහිත මෙහෙයුම් වශයෙන් නම් කරනු ලැබීමෙන් පසුව, තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් සහ තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම්, පනතේ 53 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව වූ නියමයක් *ගැසට් පත්‍රයේ* පළකිරීමේ දිනයේ සිට අවුරුදු විස්සක කාලසීමාවක් සඳහා, පනතේ II වන උපලේඛනයේ දක්වා ඇති පනත්වලින් හෝ ඒවා යටතේ නිදහස් කිරීම්වලට හෝ දිරිගැන්වීම්වලට හිමිකම් ලැබිය යුතු ය.

4. 3 වන නියෝගය යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වලට හෝ දිරිගැන්වීම්වලට හිමිකම් ලැබීමේ කාර්යය සඳහා, තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් හෝ තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම් පිළිබඳ ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරන බලයලත් තැනැත්තකු, මේ නියෝග *ගැසට් පත්‍රයේ* පළකරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලසීමාවක් ඇතුළත මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවල -

''පනත'' යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ;

''බලයලත් තැනැත්තා" යන යෙදුමට පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

''කොළඹ වරාය නගරය (තීරුබදු රහිත මෙහෙයුම්) රීති'' යන්නෙන්, 2023 මැයි මස 22 වන දින අංක 2333/14 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද, 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (තීරු බදු රහිත මෙහෙයුම්) රීති අදහස් වේ;

''කොමිෂන් සභාව'' යන්නෙන්, පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ;

''තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම්'' යන්නෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බහුවිධ තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම්වලින් සමන්විත තීරු බදු රහිත සාප්පු සංකීර්ණ එකක් හෝ වැඩි ගණනක් සහ ඒ තීරු බදු රහිත සාප්පු සංකීර්ණවල යටිතල පහසුකම් සංවර්ධනය කරන සහ කළමනාකරණය කරන බලයලත් තැනැත්තකුගේ මෙහෙයුම් අදහස් වේ;

'තීරු බදු රහිත මෙහෙයුම්''' යන්නෙන්, තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් සහ තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම් අදහස් වේ; සහ

''තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම්'' යන්නෙන්, කොළඹ වරාය නගරය (තීරු බදු රහිත මෙහෙයුම්) රීතිවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව, තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම් පවත්වා ගෙන යන බලයලත් තැනැත්තකුගේ මෙහෙයුම් අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.